සියලුම හිමිකම් ඇවිරිණි - All Rights reserved

# බප/ජය ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය -2019

## දේශපාලන විද්‍යාව - II ප්‍රශ්න පත්‍රය

## 13 ශ්‍රේණිය

**කාලය පැය 03යි**

**උපදෙස්** - මෙම ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් සමන්විත වේ. I කොටස ප්‍රශ්න 03කින් සමන්විත වන අතර, ඉන් ඔබ තෝරාගත් එක් ප්‍රශ්නයකට අනිවාර්යයෙන්ම පිළිතුරු සැපයිය යුතුවේ. II කොටස ප්‍රශ්න ප්‍රශ්න 04කින් සමන්විත වන අතර, ඉන් ඔබ තෝරාගත් ප්‍රශ්න දෙකකට අනිවාර්යයෙන්ම පිළිතුරු සැපයිය යුතුවේ. III කොටස ප්‍රශ්න 03කින් සමන්විත වන අතර, ඉන් ඔබ තෝරාගත් එක් ප්‍රශ්නයකට අනිවාර්යයෙන්ම පිළිතුරු සැපයිය යුතුවේ. පසුව II කොටස හැර සෙසු I කොටස හා III කොටස යන කොටස් දෙකෙන් ඔබ කැමති කොටසකින් තවත් ප්‍රශ්නයක් ඇතුළුව සම්පූර්ණ ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.

### I **කොටස**

01) "දේශපාලනය සමාජ පරිමණ්ඩලය තුළත් පුද්ගලික පරිමණ්ඩලය තුළත් සිදුවන ක්‍රියාදාමයකි" සාකච්ඡා කරන්න. ( ලකුණු 20)

02) පහත සඳහන් මාතෘකා අතරින් ඕනෑම මාතෘකා දෙකක් පිළිබඳ සාකච්ඡා කරන්න.

I. චර්යාවාදයේ මූලධර්ම
II. සක්‍රීය සිවිල් සමාජය
III. නූතන රාජ්‍යය තුළ පුරවැසියා ( ලකුණු 10 x 2)

03) පහත සඳහන් මාතෘකා අතරින් ඕනෑම දෙකක් පිළිබඳ සාකච්ඡා කරන්න

I. නව ලිබරල්වාදි දේශපාලන චින්තනය
II. ජෝන් ලොක්ගේ සීමිත ආණ්ඩුකරණය
III. නූතන නිරාගමික වාදී රාජ්‍යය ( ලකුණු 10 x 2)

### II **කොටස**

04) ශ්‍රී ලංකාවේ යටත් විජිත ආණ්ඩු ක්‍රම ප්‍රතිසංස්කරණ හේතුවෙන් මෙරට ඇති වූ සමාජ/ ආර්ථික/ දේශපාලන පරිවර්තනයන් සාකච්ඡා කරන්න. ( ලකුණු 20)

05) ඩොනමෝර් ආණ්ඩු ක්‍රමයට අදාළව පහත සඳහන් මාතෘකා අතරින් ඕනෑම මාතෘකා දෙකක් පිළිබඳ සාකච්ඡා කරන්න.

I. සර්ව ජන ඡන්ද බලයේ සාධනීය පැතිකඩ
II. ආණ්ඩුකාරවරයාගේ බලතල හා කාර්යයන්
III. අමාත්‍ය මණ්ඩලයේ ක්‍රියාකාරිත්වය ( ලකුණු 10 x 2)

සියලුම හිමිකම් ඇවිරිණි - All Rights reserved

06) 1947 සහ 1972 ආණ්ඩු ක්‍රමයන්ට අදාළව පහත සදහන් මාතෘකා අතරින් ඕනෑම මාතෘකා දෙකක් තුලනාත්මකව සාකච්ඡා කරන්න.

I. වෙස්ට්මින්ස්ටර් ආකෘතිය
II. පාර්ලිමේන්තු ස්වාධිපත්‍යය
III. නාමික විධායකය ( ලකුණු 10 x 2)

07) පහත සදහන් මාතෘකා අතරින් ඕනෑම මාතෘකා දෙකක් පිළිබද සාකච්ඡා කරන්න.

I. 1947 ආණ්ඩු ක්‍රමයේ සුළු ජන අයිතීන්
II. 1972 ආණ්ඩු ක්‍රමයේ ව්‍යවස්ථා අධිකරණය
III. 1978 ආණ්ඩු ක්‍රමය හදුන්වාදීමේ පසුබිම ( ලකුණු 10 x 2)

## III **කොටස**

08) ඉන්දියානු ආණ්ඩු ක්‍රමයේ පෙන්නුම් කෙරෙන ඒකීය ආණ්ඩු ක්‍රමයක ලක්ෂණ ආණ්ඩු ක්‍රමයේ විධිවිධානයන්ට අදාළව සාකච්ඡා කරන්න. ( ලකුණු 20)

09) පහත සදහන් මාතෘකා අතරින් ඕනෑම මාතෘකා දෙකක් පිළිබද සාකච්ඡා කරන්න.

I. රාජ්‍යය අභ්‍යයන්තර ගැටුම්
II. ශ්‍රී ලංකාව හා ප්‍රජාතන්ත්‍රවාදය
III. නූතන ජාතික රාජ්‍යය මුහුණ දෙන අභියෝග ( ලකුණු 10 x 2)

10) පහත සදහන් මාතෘකා අතරින් ඕනෑම මාතෘකා දෙකක් පිළිබද සාකච්ඡා කරන්න.

I. වත්මන් ශ්‍රී ලංකාවේ විදෙස් පිළිවෙත
II. ශ්‍රී ලංකාවේ සහාග ආණ්ඩු බිහිවීමේ ප්‍රවණතාවය
III. ආණ්ඩුව හා පාලන තන්ත්‍රය
IV. සමාජවාදි රාජ්‍යය මාදිලියක ලක්ෂණ ( ලකුණු 10 x 2)

සියලුම හිමිකම් ඇවිරිණි - All Rights reserved

# බප/ජය ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2019

## දේශපාලන විද්‍යාව - I ප්‍රශ්න පත්‍රය

## 13 ශ්‍රේණිය

**කාලය පැය 02යි**

**සැලකිය යුතුයි :**

- **1 ප්‍රශ්න පත්‍රය A සහ B යනුවෙන් කොටස් දෙකකින් සමන්විත වේ.**
- **A කොටස බහුවරණ ප්‍රශ්න 30කින් සමන්විත වේ. එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් ප්‍රශ්න 30ට ලකුණු 60කි. සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **B කොටස කෙටි පිළිතුරු සැපයීම් වර්ගයේ ප්‍රශ්න 20 කින් සමන්විත වේ. එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් ප්‍රශ්න 20ට ලකුණු 40කි. සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **1 පත්‍රය සඳහා මුළු ලකුණු සංඛ්‍යාව 100 කි. සියලුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේම සැපයිය යුතුය.**

### A කොටස

- **ප්‍රශ්න අංක 01 සිට 20 දක්වා ඇති ප්‍රශ්නවල දී ඇති ප්‍රකාශ කියවා වඩාත් නිවැරදි ප්‍රකාශය හෝ ගැලපෙන ප්‍රකාශය තෝරන්න.**

01) දේශපාලනය යනු

1. මිනිසාගේ පුද්ගලික භාවිතාව හා සමාජ භාවිතාවෙන් පරිබාහිර වන්නා වූ ක්‍රියාවලියකි.
2. දේශපාලන වෘත්තිකයින්ගේ ක්ෂේත්‍රයට පමණක් අදාල වන්නා වූ භාවිතාවයකි.
3. සම්භාව්‍ය අර්ථයෙන් ආණ්ඩු කිරිම කේන්ද්‍රීය වූ නමුත් නූතනයේ සමාජ කේන්ද්‍රීය භාවිතයක් ලෙස ද විග්‍රහ කෙරේ.
4. ආණ්ඩුකරණයට පමණක් සීමා කරන ලැබූ බලය ලබාගැනීම සඳහා වූ ක්‍රීඩාවකි.
5. දේශපාලන දාර්ශනිකයින්ට පමණක් අනන්‍ය වන්නා වූ ක්‍රියාවලියකි. (--------)

02) දේශපාලන විද්‍යාව

1. ක්‍රි. පූ 04 වන සියවසේ ග්‍රීසියෙන් ඇරඹි ශාස්ත්‍රීය සමාජීය විද්‍යා ශික්ෂණ ධාරාවයි.
2. දේශපාලන විද්‍යාව යනු සත්‍ය ගවේෂණය කරන අවලෝකන විද්‍යාක් ලෙසින් ඇරිස්ටෝටල් හඳුන්වා ඇත.
3. දේශපාලන විද්‍යාවේ න්‍යාය, සංකල්ප හා ප්‍රවේශයන් නොවෙනස්ව ඉදිරියට පැමිණ ඇත.
4. දේශපාලන විද්‍යාව යන අදහස මුලින්ම ප්‍රකාශ කලේ ප්ලේටෝ ය. එය දේශපාලනය පිළිබඳ ඥානය සම්බන්ධ ශාඛාවක් ලෙසින් හැඳින්විය.
5. වෙනත් සමාජීය විද්‍යාවන් ආනුභූතික විද්‍යාවන් බවට පරිවර්තනය වූවත් දේශපාලන විද්‍යාව එයට හසු නොවුණි.

(--------)

03) දේශපාලන දර්ශනය

1. ආනුභූතික වාදින්ගේ වර්ධනය සමගින් දේශපාලන දර්ශනවාදය දේශපාලන විද්‍යාවේ ප්‍රධාන ප්‍රවේශය බවට පත්විය.
2. ප්‍රත්‍යක්ෂමූලික වන්නා වූ දේශපාලන සංසිද්ධින් දර්ශනවාදයේ ආරම්භයේ සිටම පරමාදර්ශ සඳහා පදනම් වී ඇත.
3. 1970 දශකයේදී දේශපාලන විද්‍යාවේ උප විෂය ක්ෂේත්‍රයක් ලෙසින් පරිවර්තනීය මාවතකට එය ප්‍රවිෂ්ට විය.
4. දේශපාලන දර්ශනිකයින්ගේ ප්‍රතිමානීය විනිශ්චයන් තුල පොදු හා ඒකමතික භාවයක් හමුවීම මෙම උප විෂය ක්ෂේත්‍රයේ සුවිශේෂිභාවයයි.
5. දේශපාලන චින්තනයෙන් පරිබාහිරව පමණක් දේශපාලන දර්ශනය හදුනා ගත හැකිය. (--------)

04) දේශපාලන විද්‍යාවේ විද්‍යාත්මක ප්‍රවේශය

1. වඩාත් පරමාදර්ශී සංකල්ප හඳුනා ගනිමින් ඒවා දේශපාලය ආයතනයන්ගේ භාවිතයන් තුලට හඳුන්වා දෙයි.
2. පුද්ගල බද්ධභාවය හා ආත්මීය භාවය මත තීරණවලට එළඹීම එකහෙලාම බැහැර නොකරයි.
3. විද්‍යාත්මක ප්‍රවේශය මුලින්ම වර්ධනය වූයේ 1940 දශකයේ ස්වභාවික විද්‍යා ක්ෂේත්‍රයේ ය.
4. රාජ්‍යය හා ආණ්ඩුව දේශපාලනයේ කේන්ද්‍රීය ආයතන ලෙසින් හඳුනාගනිමින් එම ආයතන අධ්‍යයනය මූලික තේමාව බවට පත්කර ගනියි.
5. දේශපාලන චර්යාව ආනුභවික පර්යේෂණ තුළින් අධ්‍යයනයට ලක් කල හැකිබව අවධාරණයකරයි. (--------)

05) දේශපාලන පක්ෂ වර්ගීකරණය අනුව

1. පුළුල් වූ සමාජ පදනමකින් ගොඩනැගෙන කේඩර පක්ෂ ප්‍රජාතන්ත්‍රවාදි දේශපාලන ආයතනයක් ලෙසින් හඳුනාගැනේ.
2. ව්‍යවස්ථාවාදි දේශපාලන පක්ෂ රාජ්‍යයේ නෛතික ව්‍යුහයේ සීමාවන් තුළ ක්‍රියාත්මක වේ.
3. විකල්පීය මතයක් දරන්නා වූ දේශපාලන පක්ෂ පවත්නා ක්‍රමවේදයට අනුගතව ක්‍රියාත්මක වේ.
4. නූතනයේ බොහෝ දේශපාලන පක්ෂ මහජන මතය හැඩගස්වන පක්ෂ ලෙසින් හඳුනා ගැනේ.
5. වාමාංශික පක්ෂ ධනවාදී පක්ෂවලට ප්‍රබල විකල්පයක් බවට පත්ව ඇත. (--------)

06) රාජ්‍යය

1. නිශ්චිත ඓතිහාසික තත්ත්වයන් තුළ බිහිවූ විවිධ මාදිලියන් ඔස්සේ වර්ධනය වූ සමාජීය ආයතනයයි.
2. සමකාලීනව එය ජාතිකවාදය තුලින් සුපෝෂිත රාජ්‍යයක් ලෙසින් පිළිගැනේ.
3. උපරි ජාතික සංවිධාන බිහිවීම යනු රාජ්‍යයේ ස්ථිතිකභාවය තවදුරටත් ශක්තිමත් වීමයි.
4. සමාජය ජගත්කරණයට ලක් වීම ජාතික රාජ්‍යයේ ස්යංතීරණ ගැනීම කෙරෙහි ප්‍රබල බාධාවක් නොවුණි.
5. පාර ජාතික සම්බන්ධතා නිසා වඩාත් ශක්තිමත් වූ ආයතනයකි. (--------)

07)"ආණ්ඩුවක් සංස්ථාපනය කළ යුත්තේ නීතියෙන් තමාට කරන්න යැයි බල කරන්නේ නැති දෙයක් කිරිමටත් නීතියෙන් කරන්නට අවසර ඇති දෙයක් නොකර සිටීමටත් කෙනෙකුට බල කරන්නේ නැති ආකාරය ය". ඉහත සඳහන් ප්‍රකාශය අනුව දේශපාලන විද්‍යාවට හඳුන්වාදී ඇති න්‍යාය වන්නේ

1. බලතල බේදීමේ න්‍යාය
2. ජනතා පරමාධිපත්‍ය පිළිබඳ න්‍යාය
3. සීමිත ආණ්ඩුව පිළිබඳ න්‍යාය
4. ස්වාධිපත්‍ය පිළිබඳ න්‍යාය
5. රාජ්‍යය පිළිබඳ බහුත්වවාදි න්‍යාය (--------)

සියලුම හිමිකම් ඇවිරිණි - All Rights reserved

08) නව ලිබරල්වාදි රාජ්‍යය

1. රාජ්‍යය ආර්ථික ක්‍රියාවලිය කෙරෙහි අවම මැදිහත්මක් අවධාරණය කරන්නා වූ මාදිලියකි.
2. ජගත් සංවිධානයන් විසින් රාජ්‍යයේ ස්වයං තීරණ අයිතිය එම රාජ්‍යය වෙත පවරාදෙයි.
3. ජනතාවගේ සුබසාධන අවශ්‍යතාවයන් සපයා දීම සඳහා රාජ්‍යයේ මැදිහත් කාර්ය අවධාරණය කරයි.
4. වෙළඳ පොළ ක්‍රියාකාරිත්වය වෙත දැඩි මිල පාලන ප්‍රතිපත්තීන් හඳුන්වා දෙමින් රාජ්‍යය එහි ඒකාධිකාරය තමා සතු කරගනියි.
5. ජනසතුකරණ ප්‍රතිපත්තීන් වෙත රාජ්‍යයේ අවධානය වැඩි වශයෙන් යොමු වෙයි. (--------)

09) මාක්ස්වාදී රාජ්‍යය

1. රාජ්‍යය කටයුතු කරන්නේ පන්ති අතර සුහදතාවයක් ඇති කිරීම සඳහා ය.
2. පන්ති රහිත සමාජයක රාජ්‍යය පැවැත්ම අනිවාර්යය වේ.
3. ධනපති සමාජ ක්‍රමයේ මූලික ස්වභාවය පිළිබඳ ගැටුමක් නොමැත.
4. පන්ති බේදීම හා ශ්‍රමය අයතා පරිදි යොදාගැනීම අහෝසි කිරීම අරමුණු කරගනියි.
5. සමාජයේ පොදු අභිවෘද්ධිය ඇති කිරීම අරමුණ කරගෙන ක්‍රියාත්මක වේ. (--------)

10) ඒකීය රාජ්‍යය

1. ජාතික බලය උප ජාතික ආයතන වෙත පැවරුවද, එසේ පවරාදුන් බලය නැවත මධ්‍ය ඒකකය වෙත පවරාගැනීම දුෂ්කර වූ කාර්යයක් බවට පත්වීම.
2. එකිනෙකින් වෙන් වූ ස්වාධීනතාවයකින් යුත් ඒකක වෙතින් තීරණ ගැනීම සීමා කරයි.
3. වඩාත් ඉක්මන් හා සරල ආණ්ඩුකරණ ක්‍රියාවලියකින් සමන්විත වන්නා වූ රාජ්‍යයකි.
4. ජන විවිධත්වය හා භෞමික වශයෙන් සුවිශාලත්වය මත ගොඩනගා ගන්නා වූ ආණ්ඩුකරණ පරිපථයකි.
5. යම් සුවිශේෂී තත්ත්වයක් මත ගොඩනැගෙන්නා වූ නූතන රාජ්‍යය මාදිලියකි. (--------)

11) ස්ත්‍රී වාදය හා සම්බන්ධයෙන් **සාවද්‍ය ප්‍රකාශය වන්නේ**

1. පිරිමින්ගේ ලෝක දර්ශනයට අනුව ස්ත්‍රීන්ගේ ජීවිතය හැඩගැස්විය යුතු බව පිළිගනියි.
2. ස්ත්‍රීන් මත පුරුෂ ලෝකය ආරෝපණය කිරීමේ මෙවලමක් ලෙසින් රාජ්‍යය ක්‍රියාත්මක වන ප්‍රකාශ කරයි.
3. බල සම්බන්ධතාවයක් ලෙසින් දේශපාලනය යන්න කුටුම්භයක් තුල ගොඩනැගෙන සම්බන්ධතා තුල පවා පවතින බව අවධාරණය කරයි.
4. පවතින ලිබරල්වාදි හා මාක්ස්වාදි මතවාද ස්ත්‍රීන්ගේ විමුක්තිය සඳහා ප්‍රමාණයවත් ද යන්න ප්‍රශ්න කරයි.
5. ලිංගිකත්වය පුමතිරිකරණය කිරීම මෙම මතවාදයේ මූලිකම අදහසයි. (--------)

12) පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමය

1. පාර්ලිමේන්තුව තුළින් හෝ ඉන් පිටස්තරව පත්වන්නා වූ දේශපාලන විධායකයකින් සමන්විත වේ.
2. කැබිනට් මණ්ඩලය පත් කිරීමේදී පාර්ලිමේන්තු සමාජිකයින්ගෙන් පත් කිරීම අනිවාර්ය නොවේ.
3. ආණ්ඩුවේ පැවැත්ම සඳහා පාර්ලිමේන්තුවේ සහයෝගය නොමැතිවීම හානිදායක නොවේ.
4. දේශපාලන විධායකය පාර්ලිමේන්තුව වෙත සාමූහිකව වගකියන්නා වූ මූලධර්මයක් මත ක්‍රියාත්මක වේ.
5. නාමික විධායක ධූරය හිස්වීම ආණ්ඩුව විසුරුවාලීම සඳහා හේතුවේ. (--------)

13) ගැටුම් සමථනය සඳහා යොදාගන්නා මාධ්‍යයක් **නොවන්නේ**

1. සහමන්ත්‍රණය
2. මැදිහත්කරණය
3. සාම ගිවිසුම්
4. ප්‍රතිචාර නැවැත්වීම
5. සාමය ගොඩනැගීම (--------)

14) බ්‍රිතාන්‍ය ආණ්ඩු ක්‍රම ප්‍රතිසංස්කරණ හේතුවෙන් ඇති වූ ආර්ථික පරිවර්තනයක් **නොවන්නේ**

1. ශ්‍රමය මුදලට අලෙවි කළ හැකි වෙළඳ පොළක් වර්ධනය කිරීම.
2. දේශිය වශයෙන් ප්‍රාග්ධනය හිමි ව්‍යවසායක පන්තීන්ගේ නිර්මාණය.
3. පාරම්පරික ඉඩම් භුක්තිය අභියෝගයට ලක්වීම හා ඉඩම් වෙළඳ පොලක් නිර්මාණය වීම
4. බිඳවැටුණු යැපුම් ආර්ථිකයත් හා ඇති වූ වෙළඳ ආර්ථිකය හේතුවෙන් දෙමුහුම් ආර්ථිකයක් නිර්මාණය වීම.
5. යටිතල පහසුකම් ක්ෂේත්‍රය අවවර්ධනයක් දක්නට ලැබීම. (--------)

15) යටත් විජිත කාලය සීමාව තුළ ශ්‍රී ලංකාවේ නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය සම්බන්ධයෙන් **අදාළ නොවන්නේ**

1. නියෝජනය කෝල්බෲක් ආණ්ඩු ක්‍රම ප්‍රතිසංස්කරණයෙන් හදුන්වා දුනි.
2. කෲව් මැකලම් ප්‍රතිසංස්කරණයෙන් පළමුවරට වත්කම හා උගත්කම මත තීරණය වන ජන්ද ක්‍රමක් මත පදනම් වන නියොජනයහදුන්වා දෙන ලදි.
3. සර්ව ජන ජන්ද බලය හඳුන්වා දීමෙන් පුරවැසියන්ගේ බහුතර කැමැත්තෙන් නියෝජිතයින් තෝරා ගන්නා ලදි.
4. සෝල්බරි ආණ්ඩු ක්‍රමයෙන් ප්‍රාදේශීය නියෝජන ක්‍රමය මත පදනම්ව නියෝජිතයින් තෝරාපත් කරන ලදි.
5. වාර්ගික නියෝජනය 20 වන සියවයේ මුල් දශකය තුල මුළුමනින්ම අවංලංගු විය. (--------)

16) ඩොනමෝර් ආණ්ඩු ක්‍රම ප්‍රතිසංස්කරණ මගින් ඇති වූ පරිවර්තනයන්ට අදාළ **නොවන්නේ**,

1. ආණ්ඩුකරණ ක්‍රියාවලිය ජනතා පරමාධිපත්‍ය මූලික කර ගනිමින් ක්‍රියාත්මක විය යුතු යැයි මූලධාර්මික පදනමක් වැටීම.
2. ජනවර්ග අතර පැවති බලවත් නොසන්සුන්තාවය මුළුමනින්ම අවසන් කිරීම
3. ප්‍රජාතන්ත්‍ර ක්‍රියාවලිය ශක්තිමත් වීම සමගින් සිවිල් දේශපාලන ක්‍රියාකාරිත්වය ව්‍යාප්ත වීම.
4. ව්‍යවස්ථා සම්පාදන ක්‍රියාවලිය මෙන්ම විධායක හා පරිපාලන ක්‍රියාවලිය පිළිබඳ අත්දැකීමක් දේශිය නියෝජිතයින්ට ලබාදීම.
5. නූතන නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය තුල දේශපාලන අයිතින් සැබෑලෙසින්ම ජනතාව අතට පත් කිරීම හා ඒ තුළින් සමාජ සජීවීකරණය වේගවත් වීම. (--------)

17) 1947 ආණ්ඩු ක්‍රමය සම්බන්ධයෙන් අදාල **නොවන්නේ**

1. වෙස්ට් මින්ස්ටර් ආකෘතිය මත පදනම් වූ ආණ්ඩු ක්‍රමයක් හදුන්වා දෙන ලදි.
2. බ්‍රිතාන්‍ය සමග තවදුරටත් ව්‍යවස්ථා සම්බන්ධතා ක්‍රියාත්මක විය.
3. කිසියම් ජන කොටසගේ වරප්‍රසාදයන් පිළිබඳ සැලකිලිමත් වෙමින් ඒ සඳහා නෛතික විධිවිධානයක් ඇතුලත් කරන ලදි.
4. පාර්ලිමේන්තුව අධිපති ආයතනය බවට පත් කරමින් ව්‍යවස්ථා සම්පාදනයේ තනි ඒකාධිකාරයක් ඒ වෙත ලබාදී තිබුණි.
5. මෙරට අධිකරණ ක්‍රියාවලිය අවසන් බලධාරී අධිකරණ ආයතන බවට තවදුරටත් නොපිළිගත්තේ ය. (--------)

18) 1972 පළමු ජනරජ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව

1. ශ්‍රී ලංකාව අනාගාමික රාජ්‍යයක් බවට පත් කිරිමට අදාළ විධිවිධාන ඇතුළත් කරන ලදි.
2. පනත්වල ව්‍යවස්ථානුකුලභාවය පරික්ෂා කිරිම සදහා වෙනම ව්‍යවස්ථා අධිකරණයක් ස්ථාපිත කෙරුණි.
3. බහු භාෂාමය පදනම ව්‍යවස්ථා විධිවිධානයක් මගින් පිළිගැනීමට ක්‍රියා කළේය.
4. මූලික අයිතීන් සදහා අධිකරණ සුරක්ෂිතතාවයක් ඇතුළත් කර තිබුණි.
5. නාමික විධායකය ව්‍යවස්ථාදායකයේ බලපෑමෙන් නිදහස් කර වගකීමේ මුක්තියක් ලබාදී තිබුණේ ය. (--------)

19) 1972 ජාතික රාජ්‍ය සභාව සම්බන්ධයෙන් අදාල **නොවන්නේ**

1. ආණ්ඩු ක්‍රමයේ 44 වන වගන්තිය මගින් ව්‍යවස්ථාදායක බලය උත්තරීතර කර තිබුණි.
2. ජනතා පරමාධිපත්‍ය බලය ක්‍රියාවට නංවන ආයතනය ජාතික රාජ්‍ය සභාව බව අවධාරණය විය.
3. පනත් කෙටුම්පතක් නීතියක් බවට පත්වූයේ ජනාධිපතිවරයාගේ අත්සනින් පමණි.
4. විධායකය පාලනය කිරීමේ හැකියාව ජාතික රාජ්‍යය සභාවට හිමි විය.
5. පවතින ව්‍යවස්ථාව වෙනුවට නව ව්‍යවස්ථාවක් සම්මත කරගැනීමේ බලය මෙම සභාව සතු විය. (--------)

20) 1978 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව

1. කැබිනට් ආණ්ඩු ක්‍රමයට මූලිකත්වය ලබාදුන් ආණ්ඩු ක්‍රමයක් හදුන්වා දුන්නේ ය.
2. ව්‍යවස්ථාදායකය පූර්ණ ස්වාධිපතීත්වය හිමිවන ඒකාධිපති ආයතනයක් ස්ථාපිත කරන ලදි.
3. ජනමත විචාරණයට ලක්වන පනත් කෙටුම්පතක් කථානායකවරයා අනුමැතියෙන් සම්මත විය.
4. පැවති මැතිවරණ ක්‍රමය එපරිද්දෙන්ම ඉදිරියට පවත්වාගෙන යාමට යෝජනා විය.
5. ජනාධිපතිවරයා හා පාර්ලිමේන්තුව අතර සහහැසිරීමක් පවත්වාගත යුතු විය. (--------)

**ප්‍රශ්න අංක 21 සිට 25 දක්වා වූ ප්‍රශ්නවලට දී ඇති ප්‍රකාශ අතරින්, නිවැරදි ප්‍රකාශය හෝ ප්‍රකාශ කාණ්ඩය ඇතුළත් වරණය තෝරන්න.**

21) බලතල බෙදීමේ න්‍යාය

A. බලතල කේන්ද්‍රගතවීම තුළින් පුද්ගල නිදහස අහිමි වන බව අවධාරණය කරමින් මෙම න්‍යාය ඉදිරිපත් කර ඇත.
B. මෙම න්‍යාය ආණ්ඩු ක්‍රම මූලධර්මයක් ලෙසින් ඇමෙරිකානු ආණ්ඩු ක්‍රමය තුල යොදාගෙන ඇත.
C. ආණ්ඩු බලය සීමිතකරණය සදහා ඉදිරිපත්ව ඇති ඉතාමත් ප්‍රායෝගික න්‍යායකි.
D. ව්‍යවස්ථාදායකය , විධායකය හා අධිකරණ ආයතන එකිනෙකින් වෙන්වීම අවධාරණය කරන්නා වූ මතවාදයයි.
E. මෙම න්‍යාය ගොඩනැගීම සදහා ඔහු ආදර්ශයට ගෙන ඇත්තේ ප්‍රංශ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවයි. (--------)

1) ABD 2) BCDE 3) A **හා** B 4) ABC 5) C **හා** D

22) ඇමෙරිකානු සංඝීය ක්‍රමය

A. ඕනෑම අවස්ථාවක වුවද ප්‍රාන්ථවලට අයත් ගුවන් තොටුපොළවල් අත්පත් කරගැනීමට ඇමෙරිකානු මධ්‍යම ආණ්ඩුවට හැකිය.
B. මධ්‍යයේ නීති නොසලකමින් නීති සම්පාදනය කිරීමට ඇමෙරිකානු ප්‍රාන්ථවලට හැකියාව පවතියි.
C. ප්‍රාන්ථ රාජ්‍ය පුරවැසිභාවය හා මධ්‍යම ආණ්ඩුවේ පුරවැසිභාවය යනුවෙන් ද්විත්ව පුරවැසිභාවයක් ඇමෙරිකානුවන්ට හිමි වේ.

D. ප්‍රාන්ථ අභ්‍යයන්තර කැරලිවලින් ප්‍රාන්ථ රාජ්‍යය ආරක්ෂා කිරිම මධ්‍යම ආණ්ඩුවේ කාර්යයක් බවට පත් කර ඇත.

E. ප්‍රාන්ථ රාජ්‍යය කටයුතු කළ යුත්තේ සම්පූර්ණ විශ්වාසය යන සිද්ධාන්තය මත පිහිටා වේ. (--------)

1) ABCD 2) BCDE 3) ABDE 4) ACDE 5) ABCE

23) ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ

A. දේශපාලන පක්ෂ සුවිශාල ප්‍රමාණයක් ලියාපදිංචි දේශපාලන පක්ෂ වුවද තවමත් එම පක්ෂ සැලකිය යුතු ප්‍රමාණයකට පාර්ලිමේන්තුව තුල නියෝජනය ලබාගැනීමට අසමත් වී ඇත.

B. ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමය තුල අධිපති පක්ෂ දෙකක් නිර්මාණය වී ඇත.

C. වාර්ගික විවිධත්වය මත දේශපාලන පක්ෂ බිහිවීමේ ප්‍රවණතාවයක් ද දක්නට ලැබේ.

D. නව වාමාංශික පක්ෂ දිගින් දිගටම පාර්ලිමේන්තුවාදය ප්‍රතික්ෂේප කරමින් විප්ලව වාදය පිළිගෙන ඇත.

E. උතුරු නැගෙනහිර නියෝජනය කරමින් නිර්මාණය වී ඇති දෙමළ ඊළාම්වාදි දේශපාලන පක්ෂ මුලින් සන්නද්ධ අරගලයක් පිළිබඳ විශ්වාසය කළ ද වත්මන ප්‍රජාතන්ත්‍රවාදි මාවත වෙත පැමිණ ඇත. (--------)

1)ABCD 2) BCDE 3) ABDE 4) ACDE 5) ABCE

24) ජාත්‍යන්තර දේශපාලන තුළ ශ්‍රී ලංකාව

A. ශ්‍රී ලංකාව වර්තමානයේ විදේශ වාණිජ ණය ආධාර මත යැපෙන රටක් බවට පත් ව තිබේ.

B. සංවර්ධනය සඳහා ලංකාවට ලබාදෙන ණය ආධාර යටතේ විවිධ කොන්දේසි ද හඳුන්වාදීම සුවිශේෂත්වයක් වී තිබේ.

C. තවමත් ශ්‍රී ලංකාවේ නීති පද්ධතිය පිළිබඳ තීරණ ගැනීමේ ස්වාධීනතාවයට හානියක් සිදුව නොමැත.

D. ගෝලීය ආර්ථික චලනයන් කෙසේ වුවත් ශ්‍රී ලංකාවේ ආර්ථිකයට එය එතරම් බලපෑමක් සිදු වී නොමැත.

E. ශ්‍රී ලංකාවේ මානව හිමිකම් සම්බන්ධයෙන් ජාත්‍යයන්තරය සැමවිටම මැසිවිලි නැගීම ප්‍රවණතාවයක් බවට පත් ව තිබේ. (--------)

1) ABC 2) ABE 3) A **හා** B 4) CDE 5) C **හා** D

25) ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය

A. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හා ඒ හා අනුබද්ධිත සන්ධානයන් තුළින් බලය ලබා ගන්නා ආණ්ඩු බොහෝ විට ආසියාවට යොමු වූ විදේස් පිළිවෙතක් අනුගමනය කරයි.

B. වර්තමනයේ ශ්‍රී ලංකාව චීනය හා ඉන්දියාව යන රටවල් සමග වැඩි වශයෙන් ආර්ථික ගිවිසුම් හා ආයෝජනයන් සඳහා නැඹුරුතාවයක් පෙන්නුම් කෙරේ.

C. ශ්‍රී ලංකාවේ දේශපාලන ස්ථාවරභාවය විදෙස් පිළිවෙත ඇඩි අනම්‍යභාවයට හේතු වී තිබේ.

D. භෞමික වශයෙන් කුඩා රාජ්‍යයක් වීමත් ආර්ථික ශක්තිය දුර්වල වීමත් විදේශ ප්‍රතිපත්තියට අභියෝගයක් වී තිබේ.

E. 2015 න් පසු එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කිසියම් ආකාරයකින් ඉන්දියාව සමග ඇඩි සමීප විදෙස් පිළිවෙතක් අනුගමනය කිරීම විශේෂත්වයක් වී තිබේ. (--------)

1) ABCD 2) BCDE 3) ABDE 4) ACDE 5) ABCE

සියලුම හිමිකම් ඇවිරිණි - All Rights reserved

**අංක 26 සිට 30 දක්වා ඇති ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. ඒ එක් එක් ප්‍රශ්න අංකයට අදාළ ව දී ඇති යෙදුම් යුගලය සම්බන්ධයෙන් පහත I වගුව සඳහා වන යොමුවෙහි සඳහන් 1, 2, 3, 4 සහ 5 යන වරණවලින් සුදුසු වරණය තෝරා එහි අංකය වරහන් තුළ ඇති තිත් ඉර මත ලියන්න.**

1 වගුව

| | | |
|---|---|---|
| සත්‍යය | සත්‍යය | 01 |
| සත්‍යය | අසත්‍යය | 02 |
| අසත්‍යය | සත්‍යය | 03 |
| අසත්‍යය | අසත්‍යය | 04 |
| සත්‍යය | සත්‍යය වන අතර පළමු ප්‍රකාශය තවදුරටත් පැහැදිළි කරයි. | 05 |

| | | | |
|---|---|---|---|
| 26) | දේශපාලනය සමාජ පරිමණ්ඩලය තුල පමණක් නොව පුද්ගල පරිමණ්ඩලය තුලද ක්‍රියාත්මක වන්නකි. | පවුල තුල දේශපාලනය පවතින බව ස්ත්‍රීවාදින් පෙන්වා දුන් අතර, ඒ තුළින් පුද්ගලයා ගොඩනාගා ගන්නා පුද්ගලික සම්බන්ධතා බල සම්බන්ධතා ලෙසින් හඳුන්වයි. | (--------) |
| 27) | ප්‍රතිමානීය විනිශ්චයන් මත පදනම්ව තීරණ ගැනීම දාර්ශනික ප්‍රවේශයේ මූලික ස්වභාවය වන අතර, චර්යාවාදය තුල ප්‍රබල විවේචනයක් එයට ඉදිරිපත් විය. | එංගන්තයේ ඇති වූ අරාජිකත්වයට විසඳුමක් ලෙසින් අසීමිත බලයක් සහිත රාජාණ්ඩු පාලකයෙකුගේ අවශ්‍යතාවය තෝමස් හොබ්ස්ගේ සම්මුතිවාදය විය. | (--------) |
| 28) | 1987 ඉන්දු ලංකා ගිවිසුම හරහා ශ්‍රී ලංකාවේ බලය බෙදා හැරීම පිළිබඳ 13 වන සංශෝධනය ඉදිරිපත් විය. | ජනතා පරමාධිපත්‍ය මත පදනම් වූ පරමාදර්ශි රාජ්‍යය මාදිලිය වන්නේ සමාජවාදි රාජ්‍යයයි. | (--------) |
| 29) | 1978 දෙවන ජනරජ අණ්ඩු ක්‍රමය මගින් පූර්ණ ස්වාධිපත්‍ය සහිත පාර්ලිමේන්තුවක් ස්ථාපිත කරන ලදි | ස්විට්සර්ලන්තත ආණ්ඩු ක්‍රමයේ මධ්‍යම ආණ්ඩුවට කැන්ටන් අභිභවා යන බලයක් ව්‍යවස්ථානුකූලව හිමි නොවේ. | (--------) |
| 30) | ශ්‍රි ලංකාවේ ක්‍රියාත්මක වන්නේ දෙමුහුම් ආණ්ඩු ක්‍රමයක් බව දේශපාලන විචාරක අදහසයි. | ශ්‍රි ලංකවේ තවමත් මූල්‍ය ක්ෂේත්‍රයේ අයිතින් කඩවීම් සම්බන්ධයෙන් සොයාබැලීම සදහා ඔම්බුඩ්මන් ධූරයක් ක්‍රියාත්මක නෙවේ. | (--------) |

සියලුම හිමිකම් ඇවිරිණි - All Rights reserved

## B කොටස

31) පහත දැක්වෙන කෘතීන් ලියන ලද දේශපාලන දාර්ශනිකයින් සඳහන් කරන්න.

I. දේශපාලනය වෘත්තියක් වශයෙන් ------------------------------------------------------------------------

II. ජාතික රාජ්‍යයේ අවසානය ------------------------------------------------------------------------------

32) පහත සඳහන් වන්නේ දේශපාලන විද්‍යාවේ අධ්‍යයන ප්‍රවේශ සම්බන්ධයෙන් ප්‍රකාශයන් ය. එම ප්‍රකාශයන් කියවා අදාළ අධ්‍යයන ප්‍රවේශය නම් කරන්න.

I. පවතින දේශපාලන න්‍යාය, සංකල්ප හා මතවාද නැවත විචාරයට ලක් කරමින් දේශපාලනය තුල දෘෂ්ටිමය හා සංකල්පිත ප්‍රවේශයක් ලෙසින් නව සංකල්ප ගණනාවක් බිහිකර ඇත.

II. ආර්ථික හා පන්තිමය මූලයන් හඳුනාගනිමින් දේශපාලනය ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ වටහා ගැනීම මෙම ප්‍රවේශයෙන් මූලික අරමුණයි.

------------------------------------------------------------------------------------------------------------------------------------

------------------------------------------------------------------------------------------------------------------------------------

------------------------------------------------------------------------------------------------------------------------------------

33) දේශපාලන මතවාදයක දැකිය හැකි ලක්ෂණ දෙකක් සඳහන් කරන්න

------------------------------------------------------------------------------------------------------------------------------------

------------------------------------------------------------------------------------------------------------------------------------

----------------------------------------------------------------------------------------------------------------------------

34) රාජ්‍යයක් සතු ස්වාධිපත්‍ය සංකල්පය සමකාලීනව මුහුණ දෙන අභියෝග දෙකක් සඳහන් කරන්න.

------------------------------------------------------------------------------------------------------------------------------------

------------------------------------------------------------------------------------------------------------------------------------

----------------------------------------------------------------------------------------------------------------------------

35) පහත දැක්වෙන ප්‍රකාශයන්ට අදාළ රාජ්‍ය මාදිලි වර්ග සඳහන් කරන්න.

I. පෞද්ගලික දේපළ මත පදනම් වන පන්ති විභේදනය සහිත සමාජයක රාජ්‍යය අනිවාර්ය අංගයකි.

II. පුද්ගලයාගේ සමස්ත ක්‍රියාකාරිත්වය පාලනය කරන උත්තරීතර හා අසහාය සමාගමකි.

------------------------------------------------------------------------------------------------------------------------------------

------------------------------------------------------------------------------------------------------------------------------------

----------------------------------------------------------------------------------------------------------------------------

36) ජාතික වාදයට අයත් ප්‍රධාන ප්‍රවේශ 03කි. ඉන් දෙකක් සඳහන් කරන්න.

------------------------------------------------------------------------------------------------------------------------------------

------------------------------------------------------------------------------------------------------------------------------------

----------------------------------------------------------------------------------------------------------------------------

සියලුම හිමිකම් ඇවිරිණි - All Rights reserved

37) ලෝකයේ පවතින ගැටුම් පිළිබඳව මහාචාර්ය පීටර් වොලන්ස්ටීන් පෙන්වා දුන් වර්ගීකරණයට අයත් ගැටුම් වර්ග දෙකක් සඳහන් කරන්න.

38) නූතන ඒකීය රාජ්‍යයක පරිපාලන බලය විසුරුවා හැරීමේ අවස්ථා කිහිපයක් හඳුනාගත හැකිය. එයින් ආකාර දෙකක් සඳහන් කරන්න.

39) නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය යටතේ ඵලදායිව පුරවැසි සහභාගීත්වය සහ වගවීම් සහතික කිරිම සඳහා මැතිවරණ ක්‍රමයක් මගින් අපේක්ෂා කළ යුතු මූලික නිර්ණායක දෙකක් සඳහන් කරන්න.

40) නූතන රාජ්‍යයන් අතර ඒකීය පරිවර්තන රාජ්‍යයන් දෙකකට උදාහරණ දෙන්න.

41) කෝල්බෲක් කැමරන් ආණ්ඩු ක්‍රම ප්‍රතිසංස්කරණ මගින් හඳුන්වා දුන් නූතන ප්‍රජාතන්ත්‍රවාදි මූලධර්ම දෙකක් සඳහන් කරන්න.

42) ඩොනමෝර් ආණ්ඩු ක්‍රමය හඳුන්වා දීමෙන් අපේක්ෂා කළ අරමුණු දෙකක් සඳහන් කරන්න.

43) 1947 සෝල්බරි ආණ්ඩු ක්‍රමය යටතේ බ්‍රිතන්‍යය සමඟ තවදුරටත් ක්‍රියාත්මක වූ ගිවිසුම් දෙකක් සඳහන් කරන්න.

සියලුම හිමිකම් ඇවිරිණි - All Rights reserved

44) 1947 සෝල්බරි ආණ්ඩු ක්‍රමයෙන් අපේක්ෂා කළ කරුණක් වූයේ සුළු ජන අයිතිවාසිකම් ආරක්ෂා කිරීමයි. එහෙත් ආණ්ඩු ක්‍රමයේ භාවිතය තුල සුළු ජන අයිතිවාසිකම් උල්ලංඝනය විය. එයට අදාළව පාර්ලිමේන්තුව තුළ සම්මත වූ පනත් දෙකක් සඳහන් කරන්න.

--------------------------------------------------------------------------------------------------------------------------------------------

--------------------------------------------------------------------------------------------------------------------------------------------

-----------------------------------------------------------------------------------------------------------------------------

45) 1972 පළමු ජනරජ ආණ්ඩුක්‍රමයට අදාළව වෙස්ට්මින්ස්ටර් ආකෘතිය අභියෝගයට ලක් වූ අවස්ථා දෙකක් ආණ්ඩු ක්‍රමයේ විධිවිධානයන්ට අදාළව සඳහන් කරන්න.

--------------------------------------------------------------------------------------------------------------------------------------------

--------------------------------------------------------------------------------------------------------------------------------------------

-----------------------------------------------------------------------------------------------------------------------------

46) 1978 දෙවන ජනරජන ව්‍යවස්ථාවට හඳුන්වාදුන් 17 වන ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ අරමුණු දෙකක් සඳහන් කරන්න.

--------------------------------------------------------------------------------------------------------------------------------------------

--------------------------------------------------------------------------------------------------------------------------------------------

-----------------------------------------------------------------------------------------------------------------------------

47) 1978 දෙවන ජනරජ ව්‍යවස්ථාවට අනුව පාර්ලිමේන්තුවට නියෝජිතයින් පත් කළ ආකාර දෙකක් සඳහන් කරන්න.

--------------------------------------------------------------------------------------------------------------------------------------------

--------------------------------------------------------------------------------------------------------------------------------------------

-----------------------------------------------------------------------------------------------------------------------------

48) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක සිවිල් සමාජ සංවිධාන දෙකක් සඳහන් කරන්න.

--------------------------------------------------------------------------------------------------------------------------------------------

--------------------------------------------------------------------------------------------------------------------------------------------

-----------------------------------------------------------------------------------------------------------------------------

49) රාජ්‍යය ප්‍රතිපත්ති සම්පාදනය චක්‍රීය ක්‍රියාවලියකි. එම ක්‍රියාවලියට අයත් පළමු හා දෙවන පියවර දෙක සඳහන් කරන්න.

--------------------------------------------------------------------------------------------------------------------------------------------

--------------------------------------------------------------------------------------------------------------------------------------------

-----------------------------------------------------------------------------------------------------------------------------

50) 18 වන ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ ස්ථාපිත පාර්ලිමේන්තු සභාවට අයත් සමාජිකයින් දෙදෙනෙක් සඳහන් කරන්න.

--------------------------------------------------------------------------------------------------------------------------------------------

--------------------------------------------------------------------------------------------------------------------------------------------

-----------------------------------------------------------------------------------------------------------------------------